**පොදු ප්‍රතිඥා ලිපිය/ හානිපූරණ ප්‍රතිරක්ෂකරගැනීම/ බිල්පත් ගනුදෙනු කිරීම**

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,**

සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය: PQ 27,

අංක. 40, නවම් මාවත,

කොළඹ 02.

20......, .......... මස ...... දින

කොළඹ දී ය.

මහත්මයාණනි,

1. මාගේ/ අපගේ ඉල්ලීම අනුව සම්පාර්ශ්වීය ඇපකර ඇතිව හෝ නොමැතිව මා/ අප විසින් ලියන ලද හෝ පිළිගන්නා ලද හෝ පිටසන් කරන ලද බිල්පත් හෝ විනිමය බිල්පත් මාගෙන්/ අපගෙන් කලින් කල ඔබගේ බැංකුව විසින් මිලදී ගැනීම, මා/ අප වෙනුවෙන් ඒවා වට්ටම් කිරීම හෝ ගනුදෙනු කිරීම පිළිබඳ සැලකිල්ලට ගෙන, මෙම ගිවිසුමේ අන්තර්ගත නිශ්චිත කරුණු අඛණ්ඩව ක්‍රියාත්මකව පවතින බවට සහ වෙනස්විය හැකි බවට මෙන්ම ඍජුව හෝ වෙනත් තැනැත්තන් හරහා එම විනිමය බිල්පත් ඕනෑම අවස්ථාවක දී මා/ අප විසින් ඔබ සමග ගනුදෙනු කරනු ලබන හෝ ඔබට විකුණනු ලැබීම් සිදුකරන සියලු ගනුදෙනු සඳහා එම නිශ්චිත කරුණු අදාලවන බවට සහ මෙම ගිවිසුම සහ මේ යටතේ වූ මාගේ/ අපගේ වගකීම් ඔබ විසින් මෙම ගිවිසුම ලිඛිතව අවලංගු කරන තෙක් සම්පූර්ණ බලාත්මක භාවයෙන් සහ ක්‍රියාත්මක භාවයෙන් පවතින බවට මා/ අප විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

2. ඔබ විසින් යෝග්‍ය බවට සලකන යම් අවදානම් සම්බන්ධයෙන් යම් විනිමය බිල්පතක් හෝ විනිමය බිල්පත් වෙනුවෙන් වූ සම්පාර්ශ්වික ඇපකරය සංයුක්තවන භාණ්ඩ රක්ෂණය කරන ලෙස (නමුත් එසේ ක්‍රියාකිරීම අනිවාර්ය නොවේ) සහ එම විනිමය බිල්පත හෝ විනිමය බිල්පත් සම්බන්ධයෙන් මාගෙන්/ අපගෙන් අයවිය යුතු මුදල සඳහා රක්ෂණ වාරික සහ එම රක්ෂණයන්හි වියදම් එකතු කරන ලෙස සහ එම භාණ්ඩ සම්බන්ධයෙන් වූ වෙනත් හිමිකම් අභිබවමින් එම භාණ්ඩ සඳහා හෝ ඒ වෙනුවෙන් ගෙවීම් කරන මට/ අපට හෝ වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් සම්බන්ධයෙන් එම රක්ෂණ වාරික සහ වියදම් යටතේ ප්‍රමුඛතාවයෙන් යුතුව එම භාණ්ඩ මත සහන ලබා ගැනීමේ මාර්ගයකට එළඹීම සඳහා සහ භාණ්ඩ ප්‍රවාහන, රක්ෂණ යන වියදම් සඳහා වූ ගෙවීම් වෙනුවෙන් අවශ්‍ය මුදල් ලබාගැනීම පිණිස එම භාණ්ඩ වලින් කොටසක් විකිණීම සඳහා සහ පොදුවේ ගත්කල වෙළඳ මහතකු සහ ඔහුගේ

අන්‍යෝන්‍ය සම්බන්ධතාකරුවකු අතර පවතින සාමාන්‍ය අවස්ථාවලට ඔබ්බට හෝ අන්‍යාකාරයකට නොවන පරිදි වෙනත් පියවර ගැනීම සහ කොමිස් මුදල් සඳහා ගාස්තු අයකිරීම මෙන්ම ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා මා/ අප විසින් ඔබ වෙත හෝ ඔබගේ නිලධරයන් හෝ නියෝජිතයන් හෝ තත්කාලයේ එම විනිමය බිල්පත හෝ බිල්පත් දරන තැනැත්තන් වෙත බලය පවරා සිටිනු ලැබේ. එම වාප්පුව හෝ ගුදම සඳහා ඔබ විසින් විරෝධතා දැක්වීමේ ඔබගේ ඉහල අභිබවා යාමේ අයිතියට යටත්ව එම විනිමය බිල්පත් ලැබුම්කරුවන් හෝ ග්‍රාහකයන් විසින් තෝරනු ලබන යම් පොදු හෝ පෞද්ගලික වාප්පුවක හෝ ගුදමක එම භාණ්ඩ ගබඩා කිරීම සඳහා මා/ අප විසින් කැමැත්ත ලබා දී සිටිනු ලැබේ.

3. යම් විනිමය බිල්පත් හෝ විනිමය බිල්පත් සඳහා කල්පිරීමේදී ගෙවීම් කටයුතු කිරීමේ දී එම විනිමය බිල්පත හෝ බිල්පත් සඳහා යථාපරිදි ගෙවීම් කිරීම වෙනුවෙන් සම්පාර්ශ්වීය ඇපකරයක් වශයෙන් ඔබ වෙත භාරදෙන ලද ලිපිලේඛන ඒවායෙහි ලැබුම්කරුවන් වෙත හෝ ග්‍රාහකයන් වෙත භාරදෙනු ලැබිය යුතු බවට වූ කොන්දේසියට යටත්ව සහ එම ලැබුම්කරු එම විනිමය බිල්පත් හෝ බිල්පත් ක්‍රියාත්මකව පවතින අතරතුරදී ගෙවීම් අත්හිටුවන, ඔහු බංකොලොත්භාවයට පත්වන හෝ ඇවරකිරීමක් සඳහා ක්‍රියාකරන අවස්ථාවක දී, එම බලය පැවරීම ඊලගට මෙහි මින්මතු ලබා දී ඇති බලයට යටත්ව පිළිගැනීම සඳහා වන ප්‍රතිග්‍රහන අවස්ථා සඳහා දීර්ඝ කිරීම සිදුකරන බවට වූ කොන්දේසියට යටත්ව එම විනිමය බිල්පත් සියල්ල හෝ යම් විනිමය බිල්පත් ප්‍රමාණයක් සඳහා කොන්දේසිමය පිළිගැනීම් සිදුකරන ලෙස මා/ අප විසින් මෙයින් ඔබවෙත හෝ ඔබගේ යම් නිලධරයන් හෝ නියෝජිතයන් වෙත හෝ තත්කාලයේ දී එම විනිමය බිල්පත හෝ බිල්පත් දරන තැනැත්තන් වෙත බලය පවරා සිටිනු ලැබේ.

4. ඉහතකී පරිදි විනිමය බිල්පත හෝ බිල්පත් කල්පිරීමට පෙරාතුව ඕනෑම අවස්ථාවකදී හෝ අවස්ථාවලදී ඔබ විසින් හෝ එම විනිමය බිල්පත්වල ප්‍රතිග්‍රාහකයන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් සුදුසු බවට සලකන ආකාරයට යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙත එම භාණ්ඩවල ඉන්වොයිස්පත්‍ර වටිනාකමින් හෝ එයට එරෙහිව ලියන ලද විනිමය බිල්පතෙහි හෝ බිල්පත්වල ඉන්වොයිස්පත්‍ර පිරිවැයෙහි ප්‍රමාණුකූල මුදල ගෙවීම මත එම භාණ්ඩ අර්ධ වශයෙන් භාරදීම හෝ භාරදීම් කටයුතු සිදුකිරීම සඳහා මා/ අප විසින් ඔබ වෙත තවදුරටත් බලය පවරා සිටින නමුත් එසේ ඔබ විසින් ක්‍රියා කිරීම විධානාත්මක නොවන බවටද පිළිගෙන සිටිනු ලැබේ.

5. එම විනිමය බිල්පත හෝ බිල්පත් ඉදිරිපත් කිරීමේ දී ප්‍රතිග්‍රහනය කිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී හෝ කල්පිරීමේ දී ගෙවීම් කටයුතු කිරීම පැහැර හැරීමේ දී ඒ පිළිබඳ

විරෝධතා දැක්වීම අත්හැරීම සඳහා ද, එවැනි පැහැර හැරීමක දී හෝ එම විනිමය බිල්පත් ලියන්නා හෝ පිළිගන්නා තැනැත්තන් ගෙවීම් කටයුතු කිරීම අත්හිටුවා ඇති, බංකොලොත්භාවයට පත්ව ඇති හෝ එම විනිමය බිල්පත හෝ බිල්පත් බලාත්මකව පවතින කාලයතුලදී ඇවරකිරීමක් සඳහා ඇතුලත්වීම කෙරෙහි ඕනෑම ආකාරයකින් පියවරගෙන ඇති අවස්ථාවක දී සහ කොන්දේසි සහිතව හෝ පරම ලෙස එම විනිමය බිල්පත් දරන්නන් විසින් යෝග්‍ය බවට සලකන අවස්ථාවලදී සහ ආකාරයට එම ගෙවීම් සඳහා වූ සම්පාර්ශ්වීය ඇපකරය සංයුක්තවන භාණ්ඩ සියල්ල හෝ එහි යම් කොටසක් විකිණීම සඳහා සහ සාමාන්‍ය කොමිස්මුදල් සහ ගාස්තු අඩුකිරීමෙන් පසුව එම විකුණුම් ප්‍රතිෂ්ඨා මුදල් එම විනිමය බිල්පතෙහි හෝ බිල්පත්වල ප්‍රති-හුවමාරුව සහ ගාස්තු සමග අදාලකර ගැනීමට; සහ එහි ශේෂයක් ඇත්නම් එම ශේෂය ඔබගේ හෝ ඔවුන්ගේ කැමැත්ත පරිදි ඇපයෙන් සුරක්ෂිත කරන ලද හෝ අන්‍යාකාරයෙන් වූ ද ඔබ හෝ ඔවුන් සතුව පවතින්නා වූ ද වෙනත් යම් මාගේ/ අපගේ බිල්පත්වලට එරෙහිව හෝ මා/ අප විසින් ඔබවෙත ලබාදිය යුතු වෙනත් යම් ණය හෝ වගකීම්වලට එරෙහිව යොදා ගැනීමට ද, එම කරුණුවලට යටත්ව නිසි පාර්ශව වෙනුවෙන් එම ප්‍රතිෂ්ඨා මුදල් පිළිබඳ සලකා බැලීමට ද මා/ අප විසින් ඔබ වෙත හෝ ඔබගේ නිලධරයන් හෝ නියෝජිතයන් වෙත හෝ තත්කාලයේ දී එම විනිමය බිල්පත හෝ විනිමය බිල්පත් දරන්නන් වෙත තවදුරටත් බලය පවරා සිටිනු ලැබේ. රක්ෂණය කරන ලද නැව හෝ භාණ්ඩ අහිමිවන ඕනෑම අවස්ථාවක දී, රක්ෂණ ඔප්පුව හෝ රක්ෂණ ඔප්පු නිශ්කාශනය කිරීම සඳහා සහ භාණ්ඩ අලෙවි කිරීමක් යටතේ වූ ප්‍රතිෂ්ඨා මුදල් මත එම කොමිස්මුදල අයකර ගැනීම සඳහා මෙන්ම අඩුකිරීම් සිදුකිරීමෙන් පසුව ශුද්ධ ප්‍රතිශ්ඨා මුදල් මෙහි මින්පෙර අවසාන වශයෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට අදාල කර ගැනීම සඳහා මා/ අප විසින් ඔබ වෙත හෝ එම රක්ෂණ ඔප්පුව හෝ ඔප්පු දරන්නන් වෙත බලය පවරා සිටින අතර රක්ෂණ මුදල් මා/ අප වෙත ලැබුණහොත් එම රක්ෂණ මුදල් ඔබවෙත වහාම ගෙවන බවටත් එසේ ඔබ වෙත ගෙවනතෙක් එම මුදල් ඔබ වෙනුවෙන් භාරයක් වශයෙන් මා/ අප විසින් දරනු ලබන බවටත් මා/ අප විසින් ප්‍රතිඥා දී සිටිනු ලැබේ. මේ වගන්තිය යටතේ නිශ්කාශනය වන සියලු මුදල් මේ යටතේ ඔබවෙත ලබාදිය යුතු යම් සහ සියලු මුදල් ගෙවීම සම්බන්ධයෙන් ඔබගේ වාසියට පවතින බවට මෙන්ම විශේෂයෙන්ම අයකරනු ලබන බවට සැලකිය යුතුවේ.

6. එම භාණ්ඩවල ශුද්ධ ප්‍රතිෂ්ඨා මුදල් හෝ රක්ෂණ ඔප්පුවේ හෝ රක්ෂණ ඔප්පුවල ප්‍රතිශ්ඨා මුදල්, ප්‍රති-හුවමාරු සහ ගාස්තු සමග එම විනිමය බිල්පතේ හෝ විනිමය බිල්පත්වල සඳහන් මුදල ගෙවීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී, එම විනිමය බිල්පත් වටිනාකම අයකර ගැනීම හෝ එහි හිඟය අයකර ගැනීමේ දී එම විනිමය බිල්පත්වල පිටසන් යොදන යම් තැනැත්තකු හෝ පිටසන් යොදන තැනැත්තන්

සම්බන්ධයෙන් වූ යම් හිමිකම්පෑම්වලට අගතියක් සිදුවීමෙන් තොරව එම හිඟය වෙනුවෙන් මාගෙන්/ අපගෙන් අයකිරීම් සිදුකරන ලෙස මා/ අප විසින් අවස්ථාවෝචිත පරිදි ඔබ වෙත හෝ ඔබගේ නිලධරයන්ගෙන් යම් තැනැත්තකු හෝ නියෝජිතයන් වෙත හෝ තත්කාලයේ එම විනිමය බිල්පත හෝ විනිමය බිල්පත් දරන්නන් වෙත බලය පවරා සිටින අතර එම ඉදිරිපත් කරනු ලබන අණකර අණකර පිළිගැනීම සඳහා මා/ අප විසින් සූදානම්ව සිටින අතර ඔබ විසින් හෝ එම දරන්නන් විසින් සපයනු ලබන ජංගම ගිණුම එම විකිණීම සහ හිඟ මුදල පිළිබඳ ප්‍රමාණවත් සාධකයක් වියයුතු බවට අවබෝධකරගෙන සිටිනු ලැබේ. ඉහතකී විනිමය බිල්පත් සම්බන්ධයෙන් අයවිය යුතු හිඟ මුදල් හෝ අයවිය යුතු මුදල් ගෙවීමේ දී ඕනෑම ආකාරයක බැංකු පොත්වල හෝ යම් ගිණුමක මාගේ/ අපගේ බැරට පවතින මුදල් හෝ අන්‍යාකාරයකින් මට/ අපට හිමිව පවතින හෝ ඉන්පසුව හිමිකම් ලබන යම් බැංකු පොත්වල හෝ ගිණුමක මාගේ/ අපගේ බැරට පවතින මුදල් හෝ මා/ අප වෙනුවෙන් ඉන්පසුව නිශ්කාශනය වන හෝ රැස්වන හෝ ලැබෙන මුදල් එම ගිණුම්වලින් සීමාව ඉක්මවා මුදල් ලබා ගැනීම මගින් පවා අදාලකර ගැනීම සඳහා මා/ අප විසින් ඔබවෙත තවදුරටත් බලය පවරා සිටින අතර මාගේ/ අපගේ ගිණුමෙන්/ ගිණුම්වලින් සීමාව ඉක්මවා මුදල් ලබාගෙන ඇති අවස්ථාවක දී, කලින් කල ඔබගේ සාමානය බැංකු ව්‍යාපාරික කටයුතුවලදී අයකරනු ලබන යම් අනුපාතිකයක් හෝ අනුපාතික යටතේ ඒමත වූ පොළිය සහ (පොළිය මත වූ පිරිවැටුම් බද්ධ සහ නෛතික වියදම් ඇතුලු) ඒ සම්බන්ධයෙන් දරන ලද සියලු පිරිවැය, වියදම් සහ ගාස්තු සමග ඉල්ලා සිටීමේ දී එම සීමාව ඉක්මවා ලබාගත් මුදල් ආපසු ගෙවන බවට මා/ අප විසින් ප්‍රතිඥා දී සිටින නමුත් මෙම බලය පැවරීම මෙහි සඳහන් විධිවිධානවලින් යම් විධිවිධානයක් යටතේ හෝ අන්‍යාකාරයකින් බැංකු කරුවකු වශයෙන් වූ යම් විධිවිධානයක් යටතේ ඔබ සතු විය හැකි වෙනත් යම් අයිතිවාසිකම්, බලතල හෝ වරප්‍රසාදවලට අගතියක් සිදුවීමෙන් තොරව සිදුවිය යුතු වේ. මේ මගින් ලබා දී ඇති අයිතිවාසිකම් සහ බලතල මෙන්ම ඉහතින්ම වූ ඡේදයේ සඳහන් අයිතිවාසිකම් සහ බලතල පරම මෙන්ම අහෝසිකල නොහැකි අයිතිවාසිකම් සහ බලතල විය යුතු අතර මේ යටතේ බැංකුව වෙත මුදල් අයවිය යුතුව පවතින තාක් දුරට මියයෑම, භුන්වත්භාවයට පත්වීම, බංකොලොත්වීම, විසුරුවා හැරීම, ඇවර කිරීම, ගණන් බේරා වසා දැමීම හෝ වෙනත්යම් ක්‍රියාකාරකමක් හේතුවෙන් හෝ ප්‍රතිවිපාකයක් හෝ වෙනත් ඕනෑම ආකාරයක අවස්ථානුගත කරුණක් මගින් එම අයිතිය හෝ බලතල අවසන් වීමක් හෝ තීරණය කිරීමක් කරනු නොලැබිය යුතු අතර එම කාරණා බලාත්මක කිරීම පිණිස, තත්කාර්ය සඳහා අවශ්‍ය විය හැකි සියලු සහ ඕනෑම ආකාරයක ක්‍රියාවක් ඉටුකිරීම සඳහා මා/ අප විසින් මෙයින් මාගේ/ අපගේ ඇටෝර්නි බලකරු (ඇටෝර්නි බලකරුවන්) හෝ නියෝජිතයා (නියෝජිතයන්) වශයෙන් බැංකුව අහෝසිකල නොහැකි ලෙස මෙයින් පත්කර සිටිනු ලැබේ.

7. එම විනිමය බිල්පත හෝ විනිමය බිල්පත් කල්පිරීමට පෙරාතුව ඕනෑම අවස්ථාවක දී, ඉහතකී විකිණීමේ බලය උපචිත වුව ද නැතහොත් උපචිත නොවූව ද, අවශ්‍යවේ නම් එම විනිමය බිල්පත්වල ලියන්නන්ගෙන් හෝ ලැබුම්කරුවන්ගෙන් ගෙවීම් ලබා ගැනීම සඳහා සහ ගෙවීම් කිරීමේ දී එම ලියන්නන් හෝ ලැබුම්කරුවන් වෙත නෛභාරපත්‍ර හෝ නැව් ලේඛන භාරදෙන ලෙස සහ ඔබ වෙත හෝ එවැනි යම් විනිමය බිල්පතක් හෝ බිල්පත් දරන්නන් සඳහා ඒ මත වට්ටම් ලබාදීම සඳහා ඉඩ ලබා දී ඇති අවස්ථාවක දී, ඔවුන් විසින් එම බිල්පත් පවත්වාගෙන යන කාලසීමාව සඳහා වර්ෂයකට සියයට පහක් නොඉක්මවන සහ අදාළ රටෙහි අවසරදී ඇති කෙටි තැන්පතු සඳහා වර්තමාන අනුපාතිකයට වඩා සියයට එකහමාරක් වූ අනුපාතිකය යටතේ ඒ මත වට්ටම් ලබාදීම සඳහා ඔබට හෝ ඔබගේ නිලධරයා හෝ නියෝජිතයන් හෝ එම බිල්පත හෝ බිල්පත් දරන්නන් වෙත මා/ අප විසින් තවදුරටත් අවසර දෙනු ලැබේ.

8. ඔබ වෙත එම සම්පාර්ශවීය ඇපකර භාරදීම මගින් එම ඇපකර අගරුවීමේදී එම විනිමය බිල්පත් වලින් යම් බිල්පතක් කෙරෙහි වූ ඔබගේ අයිතිවාසිකම් සඳහා අගතියක් නොවිය යුතු මෙන්ම ඒ මත ගනුලබන යම් පූර්ව පියවරක් මගින් ඉහතකී ආකාරයට ඔබ වෙත මාගේ/ අපගේ වගකීම පවතින තාක්දුරට එම ඇපකර සඳහා වූ ඔබගේ හිමිකම සඳහා බලපෑමක් නොවිය යුතු බවට සහ මෙම ගිවිසුම එහි ක්‍රියාකාරීත්වය සහ බලපෑම අනුව අතීතයට බලපාන ගිවිසුමක් වන බවට මෙන්ම කලින් කල අපගේ සමාගම සංයුක්තවන තැනැත්තන් මියයෑම, විශ්‍රාම යෑම, අලුත් හවුල්කරුවන් හඳුන්වාදීම හෝ අන්‍යාකාර හේතුවක් නිසා අපගේ සමාගමේ සිදුවන වෙනස්කම් නොලසකා හරිමින් හෝ අප විසින් වර්තමානයේ දී හෝ අනාගතයේ දී කලින් කල ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබන වෙනත් යම් සමාගම් අභිධානයක් හෝ සමාගම් නාමයක් වෙනස්වීම නොලසකා හරිමින් මෙම ගිවිසුම මා/ අප සමග පවතින සියලු අතීත, වර්තමාන මෙන්ම අනාගත ගනුදෙනු සඳහා අදාලවන බවට මෙන්ම මෙම ලේඛනය සහ මෙයින් ලබාදෙන බලතල සහ අධිකාරී බලය ඉහතකී ආකාරයට ඔබ සමග සමාගමේ පාර්ශවයෙන් වූ ගිවිසුම ලෙස යහපත් අයුරින් දරනු ලැබිය යුතු බවටත් මේ යටතේ වූ යම් විනිමය බිල්පතක් හෝ විනිමය බිල්පත්වල එක් එක් ගනුදෙනුව මෙම ගිවිසුමේ එම අවස්ථාවේ දී පැවති නියම ප්‍රකාරව සමාගම විසින් හෝ වෙනුවෙන් කරනු ලබන අලුත් කිරීමක් වශයෙන් සලකනු ලැබිය යුතු බවටත් අන්‍යෝන්‍ය වශයෙන් එකඟව සිටිනු ලැබේ. ඕනෑම කාර්යයක් සඳහා ඔබ විසින් සේවයේ නියුක්ත කරන ලද යම් තැරැව්කරුවකු හෝ වෙන්දේසිකරුවකු විසින් සිදුකරනු ලබන යම් පැහැරහැරීමක් සම්බන්ධයෙන් ඔබ වගකියනු නොලැබිය යුතු බවටද එකඟව සිටිනු ලැබේ.

9. මාගෙන්/ අපගෙන් කිසිදු විමසීමකින් හෝ තවදුරටත් බලය ලබා ගැනීමෙන් තොරව ඔබ විසින් එසේ මිලදීගත් දේශීය/ විදේශීය බිල්පත් සම්බන්ධයෙන් ඔබගෙන් ඉල්ලා සිටින යම් ගෙවීම් සිදුකිරීම සඳහා සහ ඔබ වෙත ඉදිරිපත්කරන යම් ඉල්ලීම්වලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා මා/ අප විසින් අහෝසිකල නොහැකි ලෙස ඔබ වෙත බලය පවරා සිටින අතර එසේ මිලදී ගනු ලබන දේශීය/ විදේශීය බිල්පත් මත ඉල්ලා සිටින හෝ ගෙවනු ලබන එම ගෙවීම් හෝ ඉල්ලීම් ඇත්ත වශයෙන්ම අයවිය යුතුද නැද්ද යන්න පිළිබඳව විමසා බැලීම සඳහා හෝ මා/ අප සහ එම දේශීය/ විදේශීය බිල්පත් ලියනු ලැබූ තැනැත්තා සහ/ හෝ පිටසන් යෙදූ තැනැත්තා අතර යම් හබකිරීම් පවතීද නැද්ද යන්න පිළිබඳව විමසා බැලීම සඳහා ඔබට වගකීමක් පැවරී නොමැති බවට මා/ අප විසින් එකඟව සිටිනු ලැබේ.

10. මා/ අප විසින් ලියන ලද හෝ පිළිගන්නා ලද හෝ පිටසන් යොදන ලද විනිමය බිල්පත් මාගේ/ අපගේ ඉල්ලීම පරිදි ඔබ විසින් මිලදීගැනීම සඳහා, වට්ටම් කිරීම සඳහා හෝ ගනුදෙනු කිරීම සඳහා එකඟවීම පිළිබඳ සැලකිල්ලට ගෙන (ඉහතකී කරුණුවලට අගති විරහිතව) එමගින් ඇතිවන ප්‍රතිවිපාකවලට එරෙහිව සහ ඔබ විසින් විඳිනු ලැබිය හැකි හෝ දරනු ලැබිය හැකි සියලු පාඩු, පිරිවැය, අලාභ සහ වියදම්වලට එරෙහිව මෙන්ම මා/ අප විසින් ලියනුලබන, පිළිගනු ලබන හෝ පිටසන් යොදනු ලබන විනිමය බිල්පත් කලින් කල මිලදී ගැනීම, වට්ටම් කිරීම හෝ ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් හෝ එයට ආශ්‍රිතව ඒ තුලින් උපචිතවන සියලු නඩු, නඩුකටයුතු, වගකීම්, හිමිකම්පෑම් සහ ඉල්ලීම්වලට එරෙහිව ඔබව හානිපූරණය කර නිදහස්ව තබන බවට මා/ අප විසින් මෙයින් එකඟව ප්‍රතිඥා දී සිටිනු ලැබේ.

11. යම් විෂමතා පැවතීම පිළිබඳ නොසලකා හරිමින් කලින් කල ඔබ විසින් මාගේ/ අපගේ ලේඛනමය බිල්පත් ගනුදෙනුකිරීම පිළිබඳ සැලකිල්ලට ගෙන, ඔබ විසින් එසේ ක්‍රියා කිරීම හේතුවෙන් උපචිත වියහැකි සියලු පාඩු, වියදම් සහ ප්‍රතිවිපාකවලට එරෙහිව ඔබව හානිපූරණයකර නිදහස්ව තබන බවට මා/ අප විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ. ලේඛන සහ අදාල ණයවර ලිපිවල සඳහන් නියම අතර පවතින යම් විෂමතා පිළිබඳ නොසලකා හරිමින් මෙම හානිපූරණය සඳහා ඔබ විසින් ගනුදෙනු කරනු ලබන ණයවරලිපි යටතේ වූ බිල්පත් ඇතුලත්වන ලෙස අදහස් වේ.

මෙයට විශ්වාසී

| |
|---|
| රු. 200/-<br>මුද්දර<br>2 ක් |

20....., ........ මස ......... දින දීය.

**සාක්ෂි. ..............................................**

**සාක්ෂි. ..............................................**

වගකීමෙන් සීමිත සමාගමක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, සමාගමේ සාංගමික ව්‍යවස්ථාව ප්‍රකාරව සමාගමේ නිල මුද්‍රාව තබා යථාපරිදි සහතික කරනු ලැබිය යුතුවේ.